ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම
ஓரியண்டல் ஸ்டுடிஸ் சொசைட்டி
THE ORIENTAL STUDIES SOCIETY OF SRI LANKA
වෙබ් අඩවිය:இணையதளம்: Website : www.oriental.lk
විද්‍යුත් ලිපිනය:மின்னஞ்சல் : Email : contact@oriental.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி அமைச்சகம்,
இசுருபாயா, பட்டாரமுல்லா, இலங்கை.
Ministry Of Education,
Isurupaya, Battaramulle, Sri Lanka.

| | | |
|---|---|---|
| මගේ අංකය: එනදු පරිந்துரை : ප්‍රාභා.ස/ විභාග My Referral : | ඔබේ අංකය: உங்கள் பரிந்துரை: Your Referral: | දිනය: தேதி: Date: 2020.03.10 |

විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

<u>ප්‍රාචීන විභාග පටිපාටියේ සංශෝධන</u>

2020 පෙබරවාරි 18 දින ඔබතුමන්ගේ ද සහභාගිත්වයෙන් රැස්වූ ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ කාරක සභාව මගින් ප්‍රාචීන විභාග පටිපාටියේ සංශෝධන කිහිපයක් කිරීමට තීරණය කරන ලදි. එම තීරණ අනුව ප්‍රාචීන විභාග සඳහා 2019 (2020) සිට ඉදිරියට බලපැවැත්වෙන පරිදි පහත සංශෝධන සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

**02. ප්‍රාචීන මධ්‍යම විභාගය හා ඊට අදාළ සංශෝධන**

I. ප්‍රධාන විෂයත්‍රයෙන් එක්වර සමත් විය හැකි ය. ඌන සාමර්ථ්‍යය අහෝසි වේ. යම් විෂයක ප්‍රශ්න පත්‍ර තුනෙන් එක් ප්‍රශ්න පත්‍රයක් පමණක් අසමත් වුවහොත් එම අසමත් ප්‍රශ්න පත්‍රයට පමණක් පෙනී සිට සමත් විය හැකි ය. එය ප්‍රධාන විෂය තුනට ම පොදු ය. යම් විෂයකින් එක් ප්‍රශ්න පත්‍රයකට වඩා අසමත් වුවහොත් අදාළ විෂය අසමත් ලෙස සැලකේ. විභාගය සම්පූර්ණ කිරීම සඳහා මුල් වරට පෙනී සිටින වර්ෂය ද ඇතුළත් ව අනුයාත වර්ෂ පහක් ලැබේ. අනෙකුත් විභාග පටිපාටි පෙර පැවති ආකාරයට ම බලපැවැත්වේ.

**03. ප්‍රාචීන පණ්ඩිත උපාධි අවසාන පරීක්ෂණය හා ඊට අදාළ සංශෝධන**

I. ප්‍රධාන විෂයත්‍රයෙන් එක්වර සමත් විය හැකි ය. ඌන සාමර්ථ්‍යය අහෝසි වේ. යම් විෂයක ප්‍රශ්න පත්‍ර හතරෙන් එක් ප්‍රශ්න පත්‍රයක් පමණක් අසමත් වුවහොත් එම අසමත් ප්‍රශ්න පත්‍රයට පමණක් පෙනී සිට සමත් විය හැකි ය. එය ප්‍රධාන විෂය තුනට ම පොදු ය. යම් විෂයකින් එක් ප්‍රශ්න පත්‍රයකට වඩා අසමත් වුවහොත් අදාළ විෂය අසමත් ලෙස සැලකේ. විභාගය සම්පූර්ණ කිරීම සඳහා මුල් වරට පෙනී සිටින වර්ෂය ද ඇතුළත් ව අනුයාත වර්ෂ හතක් ලැබේ. අනෙකුත් විභාග පටිපාටි පෙර පැවති ආකාරයට ම බලපැවැත්වේ.

II. එසේ ම ප්‍රාචීන පණ්ඩිත අවසාන උපාධි පරීක්ෂණය සඳහා 2017 වසරට පෙර පැවැති විෂය නිර්දේශයෙන් පෙනී සිට අසමත් වූ අයට ද තමන් මුල් වරට පෙනී සිටි වර්ෂය ද ඇතුළත් ව අනුයාත වර්ෂ හතක් තුළ විභාගයට පෙනී සිට සාමර්ථ්‍යය ලබාගැනීමට ද අවස්ථාව සලසා දී ඇති බැවින් 2019 (2020) වර්ෂය සඳහා පමණක් පැරණි නිර්දේශය ද ඇතුළත් වන පරිදි ප්‍රශ්න පත්‍ර සකස් කිරීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

III. තව ද 2017 වසරට පෙර පැවැති ප්‍රාචීන විෂය නිර්දේශය හා දැනට පවතින විෂය නිර්දේශය අතර බොහෝ සමානතා පවතින බව නිගමනය කළ ප්‍රාචීන කාරක සභාව මගින් උක්ත විෂය නිර්දේශ දෙකින් ම හෝ ප්‍රාචීන මධ්‍යම හා අවසාන විභාගය සම්පූර්ණ කරන ලද විභාග අපේක්ෂකයින්ට ද විභාග සාමර්ථ්‍යය ලබා දිය යුතු යැයි අනුමත කළ හෙයින් ඒ පිළිබඳව ද අදාළ කටයුතු ක්‍රියාත්මක කරන ලෙස දන්වා සිටිමි.

පූජ්‍ය බණ්ඩාරවෙල රතනසාර හිමි,
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාචීන),
ලේකම්, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම.



Scanned with CamScanner